3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. 000

ආදායම් කේතය	ආදායම් සංග්‍රහයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසාන ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2003-02-99	පරිපාලන ගාස්තු සහ ගාස්තු	40.00	40.00	88.17	220.4
2002-02-99	පොලී-වෙනත්	1.50	1.50	1.21	80.7

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. 000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රති	අවසාන		
පුනරාවර්තන	318,595,000	318,595,000	305,065,924	95.64
ප්‍රාග්ධන	822,100,000	823,823,000	619,809,379	73.24

3.8 වෙනත් අමාත්‍යාංශයෙන් / දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන නොලැබුණි

අදාල නැත.

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. 000

වත්කම් කේතය	කේත විස්තරය	සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව ශේෂය 31/12/2019	2019/12/31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාවට අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි සහ ව්‍යුහ	-	157273	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	292161	-	-
9153	ඉඩම්	-	87407	-	-
9154	අස්පෘෂ්‍ය වත්කම්	-	14528	-	-

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ටීඒඕ/ඊ/සිසිඩී/02/21/04

ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2022 ජූනි 09 දින

ලැබුණා
09 JUN 2022
මූදල් අංශය

අධ්‍යක්ෂ ජනරාල්
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම

විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණය අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූප වී නොතිබුණි.

2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි 7.2 වගන්තිය ප්‍රකාරව වෙනත් ආදායම් ගණන් දීමේ නිලධාරීන් වෙනුවෙන් වාර්තාකරන ආයතනය විසින් එකතු කරන ලද ආදායම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුලත්

නොකර අග්‍රිම සැසඳුම් ප්‍රකාශය තුළ ගැලපීම් කර තිබුණද, ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

1.6.1.1 අග්‍රිම සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ දැක්විය යුතු අනෙකුත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් එකතු කරන ලද ආදායම රු. 104,663,433 ක් වුවද, එය රු 88,761,535.ක් ලෙස දක්වා තිබුණි.

(ආ) අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් දරන ලද රු.507,265 ක වියදම අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණ ශේෂය රු.548,611,863 ක් වුවත්, භාණ්ඩාගාර මුද්‍රිත අනුව 2021 ජනවාරි 01 දිනට දේපළ පිරියත හා උපකරණ ශේෂය රු. 550,334,614 ක් වූයෙන් එම ශේෂයෙහි රු.1,722,752 ක වෙනසක් පෙන්නුම් කර ඇති අතර එම වෙනසට හේතුව සටහනක් මගින් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ධාවන තත්ත්වයේ පවතින වාහන 02 ක තක්සේරු වටිනාකමින් එකතුව රු.7,800,000 ක් වුවද 2021 දෙසැම්බර් 31 දින වන විටත් ගිණුම්ගත කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

අංක 1401 (ප්‍රවාහන) වැය විෂය සඳහා සලසා තිබුණු රු.3,800,000 ක අයවැයගත ප්‍රතිපාදනයෙන් රු.2,150,000 ක් ඉතිරි වී තිබුණු අතර ඉන් රු.2,000,000 ක්, එනම් මුල් අයවැයගත ප්‍රතිපාදනයෙන් සියයට 52.6 ක් පිළිවෙලින් වැය විෂයය අංක 1404 (බදු සහ

පළාත් පාලන ආයතන බදු) සඳහා රු.800,000 ක් ද, වැය විෂය අංක 1409 (වෙනත් සේවා) සඳහා රු.1,200,000 ක් ද වශයෙන් මාරු කර තිබුණි. එලෙස ප්‍රතිපාදන මාරු කිරීමට ඉදිරිපත් කර තිබූ හේතුව ලෙස රථ වාහන දීමනා හිමි නිලධාරීන් ස්ථාන මාරුවීම් ලෙස සඳහන් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ ප්‍රවාහන දීමනා ගෙවීම් පිළිබඳ පරීක්ෂාවේදී එම හේතුව පිළිගත හැකි බවට සනාථ නොවුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 94(1) හි විධිවිධාන ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල මුල් ප්‍රතිපාදන ඇත්නම් විනා සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට නොබැඳී සිටිය යුතු වූ නමුත්, අංක 1101 (දේශීය ගමන් වියදම්) දරන වැය විෂයය සඳහා ප්‍රතිපාදන නොතිබියදී රු.1,332,911 ක බැරකම්වලට එළඹ තිබුණි.

(ආ) අංක 1409 (වෙනත් සේවා) වැය විෂයයට අයත් වන රු.7,604,211 ක් වූ සමාලෝචිත වර්ෂයට අදාළ බැරකම් තුළ, ධීවර අමාත්‍යාංශය වෙත 2018, 2019 සහ 2020 වර්ෂ වෙනුවෙන් ගෙවිය යුතු රු.5,713,421 ක ආරක්ෂක සේවා මුදලක් ද 2019 හා 2020 වර්ෂ වෙනුවෙන් ගෙවිය යුතු රු.1,890,790 ක සනීපාරක්ෂක සේවා වියදමක්ද ඇතුළත් කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ රු.1,570,041 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ සංශෝධිත පනත	
31(4) වගන්තිය	2015 සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා දෙපාර්තමේන්තුව විසින් අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා රු.2,539,683 ක් වියදම් කර තිබුණු නමුත් එම මුදලින් දෙපාර්තමේන්තුව වෙත අයකර ගතයුතු රු.1,984,556 ක මුදලක් මෙතෙක් අයකර ගෙන නොතිබුණු අතර, අයකර ගතයුතු

		මුදල් වටිනාකම දරන ලද මුළු වියදමින් සියයට 78.1 ක් වී තිබුණි.
	(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 4.3.1 (අ) වගන්තිය	ප්‍රසම්පාදනයට සූදානම් වීමේ කටයුතුවල වියදම් සහ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් පසු සිදුවන කටයුතුවල වියදම් මුළු පිරිවැය ඇස්තමේන්තුවේ වෙන් වශයෙන් සඳහන් කළ යුතු වුවද ලංසු කැඳවීමේ ආරාධනය වෙනුවෙන් සිදු කරනු ලබන පුවත්පත් දැන්වීම් වියදම් මුළු පිරිවැය ඇස්තමේන්තුවට ඇතුලත් කර නොතිබුණි.

2.4 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවලට හා අනෙකුත් විශේෂිත කාර්යයන් සඳහා සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 10 කදී නිලධාරීන් 08 දෙනෙකු වෙත ලබාදුන් රු.177,000 ක අත්තිකාරම් මුදලින් රු.118,253 ක මුදලක් භාවිතයට නොගෙන නැවත පියවා තිබුණි. එසේ මුදලින් නැවත පියවූ මුදල ලබාදුන් අත්තිකාරම් මුදලින් සියයට 56 සිට සියයට 95 අතර පරාසයක් වී තිබුණි.

(ආ) තවද පළමු අත්තිකාරම වූ රු.25,000 පියවා නොනිබියදී දෙවන අත්තිකාරම වූ රු.100,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී එකම නිලධාරියෙක් වෙත අවස්ථා දෙකකදී ලබාදී තිබුණු අතර එම මුදලින් කිසිදු උපයෝජනයක් සිදු නොකර මාස 04 ක් සහ මාස එකහමාරක කාල පරාසයක් ගත වීමෙන් පසුව නැවත පියවා තිබුණි. එලෙසම රු.30,000 ක අත්තිකාරම් මුදලක් ලබාගත් නිලධාරියෙකුද එම මුදලින් කිසිදු උපයෝජනයක් සිදු නොකර මාස 08 ක කාලයක් ගතවීමෙන් පසුව නැවත පියවා තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයක් කරනු ලැබේ.

(අ) 2012 සිට 2021 දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව හඳුනාගන්නා ලද අනවසර ඉදිකිරීම් 2341 කින් ඉවත් කිරීමට යෝජිත අනවසර ඉදිකිරීම් 1721 ක් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2021 දෙසැම්බර් 31 දින වන විට කඩා ඉවත් කිරීම සඳහා නියෝග නිකුත් කළ අනවසර ඉදිකිරීම් 2074 කින් කඩා ඉවත් කළ සංඛ්‍යාව 446 ක් වූ අතර, එය කඩා ඉවත් කිරීම සඳහා නියෝග නිකුත් කළ අනවසර ඉදිකිරීම් සංඛ්‍යාවෙන් සියයට 21.5 ක් වී තිබුණි.

3.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 වර්ෂයේ කළුතර කැලිඩෝ වෙරළේ මීටර් 400 ක් දිග රිවට්මන්ට් බැම්ම ඉදිකිරීම සඳහා ප්‍රතිපාදිත රු.මිලියන 58 කින් 2021 දෙසැම්බර් 31 දිනට ඌණ උපයෝජිත ප්‍රතිපාදනය රු.මිලියන 22 ක් වී තිබුණු අතර එදිනට සියයට 33 ක භෞතික ප්‍රගතියක් පමණක් පෙන්නුම් කෙරුණි.

(ආ) ලුනාව මීටර් 500 ක රිවට්මන්ට් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සඳහා ප්‍රතිපාදිත රු.මිලියන 25 කින් 2021 දෙසැම්බර් 31 දිනට ඌන උපයෝජිත ප්‍රතිපාදනය රු.මිලියන 16.1 ක් වී තිබුණු අතර එදිනට සියයට 25 ක භෞතික ප්‍රගතියක් පමණක් පෙන්නුම් කෙරුණි.

(ඇ) මුතුපන්තිය උතුර මීටර් 115 රිවට්මන්ට් බැම්ම දීර්ඝ කිරීම වෙනුවෙන් රු.මිලියන 11 ක ප්‍රතිපාදන සලසා තිබුණද, එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය යන්ත්‍ර සපයා ගැනීමට නොහැකිවීම හේතුවෙන්, 2021 දෙසැම්බර් 31 දිනට ඌණ උපයෝජිත ප්‍රතිපාදනය රු.මිලියන 5.7 ක් වී තිබුණු අතර එදින වන විට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

3.1.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

2021 වර්ෂයේ හදිසි වෙරළ සංරක්ෂණ වැඩ යටතට ඇතුළත් කර තිබූ පහළ කටුනේරිය බෑංකඩ හන්දියේ මීටර් 250 ක රිවට්මන්ට් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් රු.56,979 ක වියදමක් දරා ව්‍යාපෘතිය නිම නොකර අත්හැර දමා තිබුණි.

3.1.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තියට අනුව සෑම අස්ථිත්වයක් විසින්ම එහි වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාවද විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භූ සළු අවශ්‍යතාවයන් නිවැරදි කාලයේ හඳුනා නොගැනීමත්, අවම තොග මට්ටම් පවත්වාගෙන නොයාමත්, යලි ඇණවුම් මට්ටම් නිවැරදිව හඳුනා නොගැනීමත් හේතුවෙන් හදිසි මිලදී ගැනීම් නිසා මිල ගණන් ඉදිරිපත් කළ එකම ආයතනයෙන් භූ සළු මිලට ගැනීමට සිදු වී ඇති අතර හදිසි මිලට ගැනීම් යටතේ 2020 දෙසැම්බර් 10 දින වර්ග මීටරයක් සඳහා රු.597.38 ක් වැය කොට තිබුණි. 2021 පෙබරවාරි 18 දින එළඹී ගිවිසුම අනුව සාමාන්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ භූ සළු වර්ගමීටරයක් රු. 382.70 ක් යටතේ මිලදී ගැනීමට හැකි වී තිබූ අතර දෙපාර්තමේන්තුව භූ සළු වර්ග මීටර් 2,320 ක් හදිසි මිලදී ගැනීම් යටතේ ප්‍රසම්පාදනය කිරීම හේතුවෙන්, වර්ග මීටරයකට රු.214.68 බැගින් රු.498,058 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) මු.රෙ.137(5) ප්‍රකාරව සැපයීම් සම්බන්ධයෙන් ඒවා පරීක්ෂා කොට නිවැරදි ලෙස භාරගෙන තිබෙන බව වවුචරය අනුමත කරන නිලධාරියා වගකිව යුතු නමුත් ලී බඩු, දෙපාර්තමේන්තුව වෙත සම්පූර්ණයෙන් ලැබී නොතිබියදී 2020 දෙසැම්බර් 31 දින ලී බඩු මිලදී ගැනීම වෙනුවෙන් ලියන ලද රු.485,255 ක් වූ චෙක්පත මාස 10 කට වඩා කාලයක් ගත වීමෙන් පසුව සැපයූ භාණ්ඩවලට පමණක් රු. 179,830 ක් ගෙවා 2021 නොවැම්බර් 03 දින ඉතිරි මුදල වූ රු.305,424 ක් පොදු තැන්පත් ගිණුමට මාරු කර තිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2018 දෙසැම්බර් 31 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018 ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක්ම වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල 04 කට අයත් ඉඩම් හා ගොඩනැගිලිද, යන්ත්‍ර 04 ක, වාහන 06 ක සහ යතුරු පැදි 08 කද වටිනාකම්, 2021 දෙසැම්බර් 31 දින වන විටත් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල 04 කට අයත් රු.103,675,000 ක් වටිනාකමැති ඉඩම් හා ගොඩනැගිලි සහ ප්‍රාදේශීය කාර්යාල 02 කට අයත් වටිනාකම් තක්සේරු කර නොමැති ඉඩම් හා ගොඩනැගිලි 2021 දෙසැම්බර් 31 දින වන විටත් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල 02 ක් ස්ථාපිත කර ඇති ඉඩම් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව මගින් දෙපාර්තමේන්තුව වෙනුවෙන් ඉඩම් ලබා දීමට අනුමැතිය ලබා දී තිබුණු නමුත් ඉඩම් පැවරුම් සහතික ලැබී නොතිබුණි.

(ඈ) වර්ෂ 16 කට සහ වර්ෂ 09 කට පෙර ව්‍යාපෘතිවලින් ලද යතුරු පැදි දෙකක් 2021

දෙසැම්බර් 31 දින වන විටත් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මොරටුව ප්‍රාදේශීය කාර්යාලයට අදාලව 2021 මාර්තු 01 දින සිදු කරන ලද 2020 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව, විකිණිය යුතු භාණ්ඩ වර්ග 29 ක් ද, විනාශ කොට දැමිය යුතු භාණ්ඩ වර්ග 05 ක් ද, ප්‍රතිසංස්කරණය කළ යුතු භාණ්ඩ වර්ග 01 ක් ද හඳුනාගෙන තිබුණි. නමුත් විගණිත දිනය වූ 2021 දෙසැම්බර් 31 දින වන විටත් එම භාණ්ඩ සම්බන්ධයෙන් අදාළ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඊ) ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලීය ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව රු.6,722,465 ක් වැය කර තිබුණු අතර එහි දෙවන මහල නිල නිවාසයක් ලෙස භාවිතා කිරීමට සැලසුම් කර තිබුණ ද එම නිල නිවාසය භාවිතයට ගෙන නොතිබුණි.

(උ) 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02(අ) ප්‍රකාරව ධාවනය තත්ත්වයේ නොපවතින වාහන 2020 දෙසැම්බර් 31 දිනට පෙර අපහරණය කළ යුතු වුවත්, වටිනාකම තක්සේරු කර නොමැති හා ධාවනය කළ නොහැකි තත්ත්වයේ පැවති කෘෂ කැබ් එකක් සහ ට්‍රැක්ටර් 4 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අපහරණය කර නොතිබුණි. තවද දෙපාර්තමේන්තුව සතු රු.11,900,000 ක් වූ එක්ස්කැවේටර් යන්ත්‍රයක් 2019 සැප්තැම්බර් මාසයේ සිට ධාවන තත්ත්වයේ නොපැවති අතර, වටිනාකම තක්සේරු කර නොමැති තවත් යන්ත්‍ර 2 ක් 2018 ඔක්තෝබර් මස සිට ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතුණු නමුත් එම යන්ත්‍ර අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.4 අනාර්ථික ගනුදෙනු

2017 ජුනි 23 දින සිට 2022 ජුනි 22 දින දක්වා වූ පස් අවුරුදු කාල සීමාවක් සඳහා මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබා ගත් වෑන් රථයක් සඳහා 2021 දෙසැම්බර් 31 දින වන විට රු.10,416,515 ක කල්බදු මුදලක් ගෙවා තිබුණු අතර, ගතවූ අවුරුදු 4 මාස 06 ක කාල පරිච්ඡේදය තුළ ධාවනය කළයුතු අවම දුර ප්‍රමාණය කිලෝ මීටර් 162,000 ක් වුවද එම රථය ධාවනය කර තිබුණු මුළු දුර ප්‍රමාණය කිලෝ මීටර් 91,132 ක් පමණක් වී තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් අවශ්‍යතා නිවැරදිව හඳුනාගැනීමකින් තොරව මෙහෙයුම් කල්බදු පදනම යටතේ ලබාගත් වෑන් රථයේ අවම ධාවන දුර ප්‍රමාණයවත් ධාවනය නොකොට කිලෝ මීටර් 70,868 ක් ඌන උපයෝජනය කිරීම තුලින් දෙපාර්තමේන්තුවට රු.4,556,775 ක මූල්‍යමය පාඩුවක් සිදු වී තිබුණි.

3.5 කළමනාකරණ දුර්වලතා

2021 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කර ඇති මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සිංහල හා දෙමළ පිටපත්වල 2020 දෙසැම්බර් 31 දිනට දක්වා ඇති වටිනාකම් වෙනුවට, 2019 දෙසැම්බර් 31 දිනට වූ සංඛ්‍යාවන් ඇතුළත් කර තිබූ බැවින් 2020 වර්ෂයට අදාළ සංඛ්‍යාවන්හි රු.74,109,979 ක ශුද්ධ වෙනසක් පැවතුණි.

4 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය 541 ක් වුවත් තථ්‍ය කාර්ය මණ්ඩලය 412 ක් වූයෙන් තනතුරු 129 ක් පුරප්පාඩුව පැවති අතර ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 14 ක්ද තෘතියික හා ද්විතික මට්ටමේ තනතුරු 57 ක් ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 58 ක් ද පුරප්පාඩුව පැවතුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ මූලික අරමුණු ඉටු කර ගැනීමට සෘජුවම අදාළ වන අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 02 ක්, ප්‍රධාන ඉංජිනේරු ඇතුළු ඉංජිනේරු තනතුරු 05 ක්, නියෝජ්‍ය සහ සහකාර අධ්‍යක්ෂ තනතුරු 05 ක් ජල විද්‍යා මිනින්දෝරු තනතුරු 02ක් වැනි ප්‍රධාන තනතුරු 14 ක් පුරප්පාඩුව පැවතුණි.

බී.ජී.අයි.නිරංජා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පරිච්ඡේදය 04

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය ප්‍රතිදානය		
	100% -90%	75% - 89%	50% -74%
ඵලදායී ආරක්ෂිත වෙරළ දිග	114%		
ඵලදායී කෘතිම වැලි පෝෂිත වෙරළ තීරයේ දිග	0		
පිරිසිදු කරන ලද වෙරළ දිග	200%		
සංරක්ෂණය කරන ලද සංවේදී කලාප වර්ග ප්‍රමාණය	0		
ප්‍රතිශ්ඨාපනය කරන ලද කඩොලාන ප්‍රමාණය			20%

ඉටුකරගත හැකි තිරසාර සංවර්ධන ඉලක්කවල (SDG) කාර්ය සාධනය

5.1 හඳුනාගත් අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක (SDG)

ආයතනික අරමුණ අනුව ඉලක්ක	ක්‍රියාමාර්ග	ජයග්‍රහණය පිළිබඳ දර්ශක	2021 ඉලක්ක	2021 ප්‍රගතිය	% 0 - 49	% 50 - 74	% 75 - 100	SDG රාමුව තුළ ලබා දී ඇති අදාළ ප්‍රතිපත්ති ඉලක්කය
13. ඉලක්ක : දේශගුණික විපර්යාස සහ එහි බලපෑම් වලට එරෙහිව සටන් කිරීමට ඉක්මන් පියවර ගන්න								
1. දේශගුණය ආශ්‍රිත වෙරළබඩ ආපදා හේතුවෙන් අහිතකර බලපෑම් වැලැක්වීම සහ සැලකිය යුතු ලෙස අඩු කිරීම	1.1. වෙරළ ආරක්ෂක ව්‍යුහ ඉදිකිරීම.	a. ඵලදායී ආරක්ෂිත වෙරළ දිග	4500m	5145m			100	13.1. සෑම රටකම දේශගුණය ආශ්‍රිත උවදුරු සහ ස්වභාවික විපත්වලට ඔරොත්තු දීමේ හැකියාව සහ අනුවර්තනය වීමේ හැකියාව ශක්තිමත් කිරීම
	1.2. කෘතිම වැලි පෝෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.	b. ස්ථාවර කරන ලද ඵලදායී කෘතිම වැලි පෝෂිත වෙරළ දිග	0	0	0			
	1.3. කඩොලාන තීර ප්‍රතිශ්ඨාපනය කිරීම.	c. වගා කරන ලද ප්‍රමාණය	1000m^2	200m^2	20%			
14. ඉලක්ක : තිරසාර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය කිරීම සහ තිරසාර ලෙස භාවිතා කිරීම								
2. සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ අඩු කිරීම සහ විවිධ ස්ථානවල වෙරළබඩ ජල තත්ත්ව පරාමිතීන් (චය) මැනීම සහ දත්ත හුවමාරු කිරීම	2.1. වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	d. පිරිසිදු කරන ලද සමුච්චිත වෙරළ දිග	2000m	4000m			100	14.1. 2025 වන විට, සමුද්‍ර සුන්බුන් සහ පෝෂක දූෂණය ඇතුළුව, විශේෂයෙන්ම ගොඩබිම පදනම් වූ ක්‍රියාකාරකම් වලින්, සියලු වර්ගවල සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ සැලකිය යුතු ලෙස අඩු

ආයතනික අරමුණ අනුව ඉලක්ක	ක්‍රියාමාර්ග	ජයග්‍රහණය පිළිබඳ දර්ශක	2021 ඉලක්ක	2021 ප්‍රගතිය	% 0 - 49	% 50 - 74	% 75 - 100	SDG රාමුව තුළ ලබා දී ඇති අදාළ ප්‍රතිපත්ති ඉලක්කය
	2.2. වෙරළබඩ ජල තත්ත්ව පරාමිතීන් මැනීම.	e. 2026 දක්වා සාමාන්‍ය වාර්ෂික වෙරළබඩ ජලයේ pH මට්ටම 8.0 ට වැඩියෙන් පවතීදැයි පරීක්ෂා කිරීම.	ස්ථාන 04ක පරාමිතීන් මැනීම සහ දත්ත හුවමාරු කිරීම.	ස්ථාන 04ක පරාමිතීන් මැනීම සහ දත්ත හුවමාරු කිරීම සිදු කර ඇත.			100	14.3 සෑම තරාතිරමකම වැඩිදියුණු කරන ලද විද්‍යාත්මක සහයෝගීතාවය ඇතුළුව සාගර ආම්ලිකතාවයේ බලපෑම් අවම කිරීම සහ ඒවාට විසඳුම් සෙවීම
3. සෞඛ්‍ය සම්පන්න සහ ඵලදායිතාවයක් ලබා ගැනීම සඳහා ඒවා ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළුව සැලකිය යුතු අහිතකර මානව බලපෑම් වළක්වා ගැනීම සඳහා සාගර සහ වෙරළබඩ පරිසර පද්ධති තිරසාර ලෙස සංරක්ෂණය කිරීම, කළමනාකරණය කිරීම සහ ආරක්ෂා කිරීම.	3.1. බලපෑමට ලක් වූ ප්‍රදේශ හඳුනාගෙන කළමනාකරණය කිරීම.	f. වැලි කඳු, කඩොලාන, ලවණ වඟුරු හා සංවේදී පරිසර පද්ධති සංරක්ෂණ කරන ලද ප්‍රමාණ	හෙක්ටයාර් 150	0	0			14.5 2020 වන විට, ජාතික හා ජාත්‍යන්තර නීතියට අනුකූලව සහ පවතින හොඳම විද්‍යාත්මක තොරතුරු මත පදනම්ව වෙරළබඩ සහ සමුද්‍ර ප්‍රදේශවලින් අවම වශයෙන් සියයට 10 ක් සංරක්ෂණය කරන්න.

5.2 තිරසාර සංවර්ධන අරමුණු වල ජයග්‍රහණ සහ අභියෝග කෙටියෙන් විස්තර කරන්න

හඳුනා ගත් තිරසාර සංවර්ධන ඉලක්ක කරා හැකි උපරිමයෙන් ළඟා වීමට උත්සාහ කරන අතර ඉන් සමහරක් ඉලක්ක පාර්ශවකාර ආයතන සමග එකමුතුව ඉටු කර ගත යුතු ව ඇත.

පරිච්ඡේදය 06

මානව සම්පත් පැතිකඩ

06.1 සේවක කළමනාකරණය

රු.000

	අනුමත සේවක	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	43	29	14
තෘතික	4	0	4
ද්විතික	322	269	53
ප්‍රාථමික	172	114	58

06.2 ** ආයතනයේ ක්‍රියාකාරිත්වයට මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය කෙටියෙන් සඳහන් කරන්න

01) සේවක ඌනතාවයක් පවතින විට ආයතනයේ කාර්යසාධනය සෘණාත්මක වීම සිදුවේ. 02) කාර්යන්වල කාර්යක්ෂමතාවය අඩුවීම මත වීම ප්‍රතිපලය ලැබේ.

06.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණුව ලත් කාර්ය මණ්ඩලය	වැඩසටහනේ කාලසීමාව	මුළු ආයෝජනය (රු. 1000)		වැඩසටහනේ ස්වභාවය (විදේශ / දේශීය)	දැනුම ලබා ගැනීම *
			දේශීය	විදේශීය		
දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා දීම සඳහා දෙමළ භාෂා පුහුණුව	30	2021/11/11 - 2021/12/31 (2022/03/10 දින දක්වා පැවැත් වේ.)	112.50		දේශීය	
ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධ පාඨමාලාව	2	2021-10-26	10.00		දේශීය	

* ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න

- ආයතනයේ විවිධ විෂයන් පිළිබඳ දැනුම යාවත්කාලීන වීම තුලින් ඵලදායිතාව ඉහල නැංවීමට හැකි වීම.
- පුහුණු වැඩසටහන් තුලින් ආකල්ප හා පුද්ගල සංවර්ධනය, සාමූහික වගකීම් වැඩි දියුණු වීම.
- සේවකයින්ගේ සේවා අවශ්‍යතා හදුනා ගැනීම තුලින් ඔවුන් ඵලදායී මට්ටමට ලගා වීමට අවශ්‍ය පහසුකම් සැපයීම කඩිකම් වීම
- පුහුණුව තුලින් ලබා ගන්නා දැනුම නව ක්‍රමවේද හා කාර්යක්ෂම කාර්යාල ක්‍රම තුලින් සේවක අභිප්‍රේරණය ඇති කිරීමට හැකි වීම.

පරිච්ඡේදය 07

අනුකූලතා වාර්තාව

අංකය	අයදුම් කිරීමේ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල / අනුකූල නොවේ)	අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම සඳහා යෝජනා කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර ඇත.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශය	අනුකූල		
1.2	රාජ්‍ය අත්තිකාරම් ගිණුම	අනුකූල		
1.3	වෙළඳ හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත් සහ ලේඛණ නඩත්තු කිරීම (FR445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ (267/2018) අනුව ස්ථාවර වත්කම් ලේඛණ නඩත්තු කර යාවත්කාලීන කර ඇත.	අනුකූල		
2.2	පුද්ගලික දීමනා ලේඛනය /පුද්ගලික දීමනා කාඩ්පත් නඩත්තු කරීම සහ යාවත්කාලීන කරීම.	අනුකූල		
2.3	විගණන විමසුම් ලේඛනය නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම.	අනුකූල		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලියාපදිංචි කර නඩත්තු කර යාවත්කාලීන කර ඇත.	අනුකූල		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශනියමිත දිනට භාණ්ඩාගාරයට (CIGAS) සකස් කර ඉදිරිපත් කරනු ලැබේ	අනුකූල		
2.6	චෙක්පත් සහ මුදල් ඇණවුම් ලේඛනය පවත්වා ගෙන යාම යාවත්කාලීන කර ඇත.	අනුකූල		
2.7	භාණ්ඩ වට්ටෝරු ලේඛනය යාවත්කාලීන කර යාවත්කාලීන කර ඇත	අනුකූල		
2.8	තොග ලේඛනය නඩත්තු කර යාවත්කාලීන කර ඇත	අනුකූල		
2.9	පාඩු ලේඛනය නඩත්තු කර යාවත්කාලීන කර ඇත	අනුකූල		
2.10	බැඳීම් ලේඛනය නඩත්තු කරීම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල		

අංකය	අයදුම් කිරීමේ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල / අනුකූල නොවේ)	අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම සඳහා යෝජනා කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ135)**			
3.1	මූල්‍යය ආයතනය තුල පවරා ගැනීම.	අනුකූල		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කිරීම	අනුකූල		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිත් මෘදුකාංග පැපකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලස්ම සකස් කිරීම	අනුකූල		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලස්ම සකස් කිරීම	අනුකූල		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලස්ම සකස් කිරීම	අනුකූල		
4.4	වාර්ෂික ඇස්තමෙන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිලිතුරු ලබා දී තිබීම	අනුකූල නොවේ	සෑම අංශයකින්ම තොරතුරු රැස් කිරීමට කාලයක් ගත වන නිසා	නිවැරදි කිරීමට උපදෙස් දෙනු ලැබ ඇත.
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මූ.රේ.134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සලස්ම සකස් කිරීම	අනුකූල		

අංකය	අයදුම් කිරීමේ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල / අනුකූල නොවේ)	අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම සඳහා යෝජනා කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිලිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	සෑම ප්‍රාදේශිය කාර්යාලයක් මගින් තොරතුරු රැස්කිරීමෙදි දිගු කාලයක් ගතවේ.	නිවැරදි කිරීමට උපදෙස් දෙනු ලැබ ඇත.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණය විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල		
7	**විගණන කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුල පවත්වාගෙන තිබීම.	අනුකූල		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියකු පත්කර එම නිලධාරියා පිළිබඳව තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සම්ක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	කොරෝනා වසංගතය හේතුවෙන් ප්‍රමාද වු බැවිනි	2020 වාර්තාව අවසන් කර ඇත

අංකය	අයදුම් කිරීමේ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල / අනුකූල නොවේ)	අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම සඳහා යෝජනා කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල නොවේ	කොරෝනා වසංගතය හේතුවෙන් ප්‍රමාද වූ බැවිනි	2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ වන විට ආරම්භව ඇති අතර 2020 වර්ෂයට අදාළ කටයුතුත් මේ සමග අවසන් වනු ඇත.
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මූ.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල නොවේ	කොරෝනා වසංගතය හේතුවෙන් ප්‍රමාද වූ බැවිනි	දැනට සිදු කරමින් පවතී. 2021 අවසන් කිරීමට බලාපොරොත්තුවේ
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමට බොහෝ කාලයක් ගත වේ.	බැහැර කිරීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවති.
9.3	වාහන ලොග් පොත පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල		
9.4	සෑම වාහන අනතුරක්ම සම්බන්ධයෙන් ම මූ.රේ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල		
9.6	කල්බදු කාල සමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල		
10	**බැකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල		

අංකය	අයදුම් කිරීමේ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල / අනුකූල නොවේ)	අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම සඳහා යෝජනා කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට වීම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන චීවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල		
11.2	මු.රේ 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදනසීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	ප්‍රමාද වී ඇත	අවශ්‍ය පියවර ගෙන තිබුණි
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සමබන්ධයෙන් මූ.රේ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලින කර පවත්වාගෙන යාම.	අනුකූල		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, වීම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	ප්‍රමාද වී ඇත	නිවැරදි කිරීමට උපදෙස් ලබා දී ඇත

අංකය	අයදුම් කිරීමේ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල / අනුකූල නොවේ)	අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම සඳහා යෝජනා කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල		
15	**අදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ අදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අදාළ නොවේ		
15.2	රැස් කර තිබූ අදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම අදායමට බැර කර තිබීම.	අදාළ නොවේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ අදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අදාළ නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ල්බිතව තිබීම.	අනුකූල		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පණතහා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙක් පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යෑම	අනුකූල		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වේබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල		
17.3	තොරතුරු දැන ගැනීමේ පණතේ 08වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා කර තිබීම	අනුකූල		

අංකය	අයදුම් කිරීමේ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල / අනුකූල නොවේ)	අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම සඳහා යෝජනා කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල		
19	**මානව සම්පත් සැලස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලස්මක් සකස් කොට තිබීම.	අනුකූල	සම්පූර්ණයෙන් අවසන් කර නොමැත.	2022 වර්ෂයේදී සම්පූර්ණයෙන් අවසන් කිරීමට බලාපොරොත්තු වේ
19.2	කාර්ය මණ්ඩලයේ සියළුම සමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩල සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	සම්පූර්ණයෙන් අවසන් කර නොමැත.	2022 වර්ෂයේදී සම්පූර්ණයෙන් අවසන් කිරීමට බලාපොරොත්තු වේ
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලස්ම පිළියෙළ කිරීම. ධාරිතා සංවර්ධනය කිරීම නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් පත් කොට තිබීම.	අනුකූල		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඳින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල		